# ආරක්ෂක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා නාවික හමුදාව

## මිල ගණන් කැඳවීමයි

## ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකා/ ආයතන සඳහා නැවුම් සහ වියළි ආහාර ද්‍රව්‍ය සැපයීම සහ බෙදාහැරීම සඳහා ප්‍රසම්පාදනය - 2026 වර්ෂය

### කොන්ත්‍රාත් හඳුනාගැනීමේ අංකය : *SLN/VICT/ 01/2026*

1. 2026 වසර සඳහා ත්‍රිවිධ හමුදාව වෙත නැවුම් සහ වියළි ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදනය වෙනුවෙන් ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SHLPC) සභාපති විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙනුවෙන් සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ සීමිත සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ආයතනයක් ලෙස ස්ථාපිත නිෂ්පාදන, තොග හා සිල්ලර මෙහෙයුම්කරුවන්ගෙන් පහත සඳහන් ආහාර කාණ්ඩ යටතේ දක්වා ඇති නෞකා/ආයතන වෙත සැපයීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. සැපයුම් වර්ෂය **2026 ජනවාරි 01 වන දින සිට 2026 දෙසැම්බර් 31 වන දින** දක්වා වර්ෂයක කාලයක් සඳහා වේ.

**1.1 ස්ථාන කණ්ඩායම් හා අනු කාණ්ඩ**

**1.1.1 (අ) කාණ්ඩය - නැවුම් ආහාර කාණ්ඩය**

| ස්ථාන | | | | ආහාර කාණ්ඩය |
|---|---|---|---|---|
| 1.1.1.1 | කොළඹ දකුණ | 1.1.1.2 | කොළඹ උතුර | 1. පිසින ලද දේශීය උදෑසන හා රාත්‍රී ආහාර |
| 1.1.1.3 | නුවර | 1.1.1.4 | ත්‍රිකුණාමලය | 2. කිරි නිෂ්පාදන/අයිස් ක්‍රීම් |
| 1.1.1.5 | මුලතිව් | 1.1.1.6 | වාකරේ | 3. එළවළු සහ පළතුරු |
| 1.1.1.7 | කින්නියා | 1.1.1.8 | තිරියාය | 4. ශීත කළ ආහාර |
| 1.1.1.9 | කන්කසන්තුරය | 1.1.1.10 | කයිට්ස් | 5. මස් වර්ග |
| 1.1.1.11 | ගාල්ල | 1.1.1.12 | තංගල්ල | 6. බේකරි අයිතම |
| 1.1.1.13 | පූනෑව | 1.1.1.14 | මන්නාරම | 7. අලුත් මාළු වර්ග |
| 1.1.1.15 | පුත්තලම | 1.1.1.16 | මුල්ලිකුලම් | 8. කුකුල් මස් |
| 1.1.1.17 | මහව | 1.1.1.18 | පානම | 9. කිකිළි බිත්තර |
| | | | | 10. ලෙලි රහිත පොල් |

**1.1.2 (ආ) කාණ්ඩය - වියළි ආහාර කාණ්ඩය**

| ස්ථාන | | | | ආහාර කාණ්ඩ | |
|---|---|---|---|---|---|
| 1.1.2.1 | කොළඹ දකුණ | 1.1.2.2 | කොළඹ උතුර | 1) කිරි පිටි වර්ග | |
| 1.1.2.3 | නුවර | 1.1.2.4 | ත්‍රිකුණාමලය | 2) බෝතල්කළ පානීය ජලය | |
| 1.1.2.5 | මුලතිව් | 1.1.2.6 | වාකරේ | 3) වියළි කරවල | 4) ආහාර පිසින තෙල් |
| 1.1.2.7 | කන්කසන්තුරය | 1.1.2.8 | ගාල්ල | 5) ධාන්‍ය වර්ග | |
| 1.1.2.9 | තංගල්ල | 1.1.2.10 | පූනෑව | 6) බේකරි නිෂ්පාදන අමු ද්‍රව්‍ය | |
| 1.1.2.11 | මන්නාරම | 1.1.2.12 | පුත්තලම | 7) අධිපෝෂ්‍යදායක ආහාර | 8) කුළුබඩු වර්ග |
| 1.1.2.13 | මුල්ලිකුලම් | 1.1.2.14 | පානම | 9) අඹරන ලද කුළුබඩු වර්ග | 10) සීනි |
| | | | | 11) ටින් කළ ආහාර | 12) බිස්කට් |
| | | | | 13) චොකලට් | 14) පැස්ටා |
| | | | | 15) කෝඩියල්/ ජෑම්/ චට්නි/ සෝස් වර්ග | |
| | | | | 16) සහල් | 17) වෙනත් ආහාර වර්ග |
| | | | | 18) තේ කොළ | 19) සලාක පැකට් |
| | | | | 20) තලකැරලි | |

**1.2** එක් එක් ආහාර කාණ්ඩයෙහි ආහාර අයිතමයන්ට අදාල පිරිවිතරයන් සහ අනෙකුත් විස්තර ලංසු ලේඛණය සමග ලබා දෙනු ලැබේ. සැපයුම් කරනු ලබන සියලූම ආහාර අයිතම නිසි ප්‍රමිතියෙන් යුතුව මිනිස් පරිභෝජනයට සුදුසු විය යුතුය. නියමිත තත්ත්ව ප්‍රමිතීන් ලංසු ලේඛණයෙහි සහ එහි ඇමුණුම්හි දක්වා ඇති අතර, ඒ අනුව සියලුම සැපයුම් 1980 හි අංක 26 දරණ ආහාර පනත හා ඊට සිදුකරන ලද සංශෝධන සහ වරින් වර බලාත්මක කරන ලද රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

**1.3 එක් එක් සැපයුම් ආයතන සහ ආහාර කාණ්ඩයන් සඳහා ලංසු ඉදිරිපත් කිරීම.**

1.3.1. එක් එක් සැපයුම් නෞකා/ආයතන සහ එක් එක් ආහාර කාණ්ඩයන් පදනම් කරගෙන වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතුය. සෑම ලංසුකරුවකු විසින්ම අදාල ආයතන වෙත සැපයුම් කිරීමට බලාපොරොත්තු වන ආහාර කාණ්ඩයෙහි ඇති සියලුම ආහාර අයිතමයන්ට ලංසු තැබිය යුතුය. ආහාර කාණ්ඩයක සියලුම ආහාර අයිතමයන්ට ලංසු නොතබන අවස්ථා වලදී එම ලංසුව ප්‍රතිචාර නොදැක්වූ ලංසුවක් සේ සලකනු ලැබේ.

1.3.2. සෑම ලංසුකරුවකුහටම පහත දක්වා ඇති ආකාරයට වෙන් වෙන් වශයෙන් ආහාර කාණ්ඩ එකකට හෝ වැඩි ගණනකට සහ සැපයුම් ආයතන එකකට හෝ වැඩි ගණනකට ලංසු තැබිය හැක. ඒ අනුව ලංසුකරුගේ හැකියාව හා සුදුසුකම් අනුව ලංසු ඇගයීම සිදු කෙරේ.

**1.3.2.1 "අ" කාණ්ඩය - එක් එක් සැපයුම් නෞකා/ආයතන සඳහා නැවුම් ආහාර අයිතමයන් සැපයුම් කිරීම.**

මෙම කාණ්ඩයෙහි ලංසු 180 ක් වන අතර, [(ආයතන 18) x (කාණ්ඩ 10) = ලංසු 180] වෙනම, මිල ඇගයීමේ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියක් වශයෙන් වෙන් වෙන්ව සිදු කරනු ලැබේ.

**1.3.2.2 "ආ"කාණ්ඩය - එක් එක් සැපයුම් නෞකා/ආයතන සඳහා වියළි ආහාර අයිතමයන් සැපයුම් කිරීම.**

මෙම කාණ්ඩයෙහි ලංසු 274ක් වන අතර [(ආයතන 14) x (කාණ්ඩ 19) + (සලාක පැකට් සැපයුම් ස්ථාන 8) = ලංසු 274] වෙනම මිලදී ගැනීමේ, මිල ඇගයීමේ සහ තෝරා ගැනීමේ ක්‍රියාවලියක් වශයෙන් වෙන් වෙන්ව සලකණු ලැබේ.

2. තෝරාගනු ලබන සැපයුම්කරුවන් විසින් කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව එක් එක් සැපයුම් ආයතන සහ අනුකණ්ඩ වෙත ආහාර ප්‍රවාහනය සම්බන්ධයෙන් වගවිය යුතුය. එක් එක් සැපයුම් ආයතන සහ අනුඛණ්ඩ පිළිබඳව විස්තර ලංසු ලේඛණයෙහි ඇතුළත් කර ඇත.

3 සැපයුම්කරුවන් තෝරා පත්කර ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 හි ඡේද 3.1.2 ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය හරහා සිදු කරණු ලැබේ. දේශීය සැපයුම්කරුවන් හට පමණක් ලංසු ඉදිරිපත් කළ හැක.

4. ලංසුකරු අසාධුලේඛණ ගත ලංසුකරුවෙකු නොවිය යුතුය.

5 අදාල සුදුසුකම් සනාථ කළ හැකි ලේඛණයන්ද ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවේදී එම සුදුසුකම් ලංසු ලේඛණ වල දක්වා ඇති විස්තරාත්මක ක්‍රමවේදය යටතේ ප්‍රමාණාත්මක ඇගයීමකට භාජනය කර එක් එක් අවම ලංසු ඉදිරිපත් කර ඇගයීමකට ලක් වූ ලංසුකරුවන් වෙත පිරිනමන උපරිම කොන්ත්‍රාත්තු ප්‍රමාණය තීරණය කරනු ලැබේ. මූලික ලංසු ඇගයීම සඳහා පහත දක්වා ඇති අවම සුදුසුකම්වත් සපුරා තිබිය යුතුය.

5.1 **ආසන්නතම මූල්‍ය වර්ෂ 03 ඇතුලත මූල්‍ය වර්ෂ 02 ක** ආහාර සැපයුම් කිරීමේ ක්ෂේත්‍රයේ අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම **රුපියල් මිලියන 08 ක්** බව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයක් මගින් සනාථ කළ යුතුය.

5.2 අවම වශයෙන් **රුපියල් මිලියන 05** ක ද්‍රවශීල (අතැති මුදල්, බැංකුවේ ඇති මුදල්, කෙටිකාලීන ආයෝජන සහ ලැබිය යුතු කෙටිකාලීන ණය) වත්කමක් ඇති බව (2023/ 2024 මූල්‍ය විගණන ප්‍රකාශණ මත පදනම්ව) ඊට අදාළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශණ මගින් තහවුරු කළ යුතුය.

5.3 කෙසේ වෙතත්, ලංසුකරු 2023/2024 වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, 2024/2025 වර්ෂය සඳහා විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන ලංසු ඉදිරිපත් කිරීමේ දිනයේදී ඉදිරිපත් කළ යුතුය.

5.4 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත දැනට ලංකාවේ ක්‍රියාත්මක වන ඕනෑම වාණිජ බැංකුවක් හෝ මූල්‍ය ආයතන විසින් මෙම ටෙන්ඩරය සඳහාම පමණක් සපයනු ලබන අවම ණය පහසුකම් සීමාව **රුපියල් මිලියන 05 ක්** විය යුතුයි.

5.5 **නැවුම් ආහාර අයිතමයන් සැපයීම** සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම්, ශීත කාමර/ අධි ශීතකරණ සහ ශීතකරණ පහසුකම් සහිත ට්‍රක් රථ (එම පහසුකම්හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/ කුලියට ලබා ගෙන තිබිය හැක.) සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කළ යුතුය. ඒ සම්බන්ධ අමතර තොරතුරු ලංසු ලේඛණය සමඟ ලබාදෙනු ලැබේ.

5.6 **වියළි ආහාර අයිතමයන් සැපයීම** සඳහා, ලංසුකරු විසින් ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම් (එම පහසුකම් හි අයිතිය ලංසුකරුගේ හෝ ඔහු විසින් බද්දට/ කුලියට ලබා ගෙන තිබිය හැක.) සපුරා ගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සඳහන් කළ යුතුය. ඒ සම්බන්ධ අමතර තොරතුරු ලංසු ලේඛණය සමග ලබාදෙනු ලැබේ.

5.7 **රාජ්‍ය/ පෞද්ගලික ආයතනවලට ආහාර ද්‍රව්‍ය (තොග/ සිල්ලර) සැපයීමට අදාළ කොන්ත්‍රාත්තු ඇතුළුව ආසන්නතම පසුගිය වසර 05 ක් තුළ වර්ෂ 02 ක් සඳහා ආහාර සැපයීම පිළිබඳ අත්දැකීම් තිබිය යුතුය.**

5.8 ලංසුකරුවන් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි විය යුතුය.

6. ලංසු ලේඛණ නිකුත් කිරීම, ලංසු ඉදිරිපත් කිරීම සහ ලංසු විවෘත කිරීම අදාල දිනය සහ වේලාව පහත පරිදි වේ

| | | |
|---|---|---|
| ලංසු ලේඛන නිකුත් කිරීම් ආරම්භ කරනු ලබන දිනය | : | 2025.06.23 |
| ලංසු ලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය සහ වේලාව | : | 2025.07.14 වන දින ප.ව 03.00 දක්වා |
| ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය සහ වේලාව | : | 2025.07.15 වන දින පෙ.ව 09.00 දක්වා |
| ලංසු විවෘත කරනු ලබන ස්ථානය, දිනය සහ වේලාව (නා.හ.මු) | : | 2025.07.15 වන දින පෙ.ව 09.30 |

(අද්මිරාල් සෝමතිලක දිසානායක ශ්‍රවණාගාරය, ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය)

7. පූර්ව ලංසු රැස්වීම **2025.06.26** වන දින **පෙ.ව 11.00 ට පළමු මහල, නන්දිමිත්‍ර ශ්‍රවනාගාරය, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,** ලිපිනයෙහි පැවැත්වේ.

8. පහත ඡේද 16 හි සඳහන් ලිපිනයෙන් ලංසුකරුගේ ලිඛිත ඉල්ලීම පරිදි **අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්)** මගින් ලංසුකරුවන් හට නැවත නොගෙවනු ලබන ගාස්තුව ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් ලංසු ලේඛනයන් මිලදී ගත හැක. එක් එක් නැව්/ආයතන සඳහා අදාළ ආපසු ගෙවිය නොහැකි ගාස්තුව PGL හි 6.2 වගන්තියට අනුකූල විය යුතුය. (එක් එක් ලංසුවට අදාලව ආපසු නොගෙවනු ලබන වටිනාකම් පිළිබඳ විස්තර පහත ඡේද 16 හි සඳහන් **අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්), ශ්‍රී ලංකා නාවික හමුදාව** යන ලිපිනයෙන් ලබා ගත හැක.)

8. ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධ්‍යක්ෂ නාවික (ජයග්‍රහණ සහ ඇඳුම් පැළඳුම්) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු, ආපසු ගෙවිය නොහැකි ගාස්තුවක් ගෙවීමෙන් පසු මිලදී ගත හැකිය. එක් එක් නැව්/ආයතන සඳහා අදාළ ආපසු ගෙවිය නොහැකි ගාස්තුව PGL හි 6.2 වගන්තියට අනුකූල විය යුතුය. (ලංසු සඳහා අදාළ ආපසු ගෙවිය නොහැකි ටෙන්ඩර් ගාස්තු කාලසටහන 16 වන ඡේදයේ දක්වා ඇති ලිපිනය වන ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධ්‍යක්ෂ නාවික (ජයග්‍රහණ සහ ඇඳුම් පැළඳුම්) වෙතින් ලබා ගත හැකිය).

9. ලංසු ඉදිරිපත් කළ හැකි වන්නේ අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්) කාර්යාලය මගින් ලබා දෙනු ලබන ලංසු ලේඛනයෙහි ඇමුණුම් අනුව පමණක් වේ. මුද්‍රා තැබූ මුල් පිටපත් සහ අනුපිටපත් ලංසු වෙන වෙනම ලියාපදිංචි තැපෑල මගින් හෝ නාවික හමුදා මූලස්ථානයේ අංක 03 දොරටුවේ (රෝහල් පිවිසුම) මේ වෙනුවෙන් තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළට ඉහත ඡේද 06 හි සඳහන් දිනය සහ වේලාවට ප්‍රථම බහාලිය යුතුය.

10. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම සඳහා ලංසුකරුවන් හෝ බලයලත් නියෝජිතයන් හට සහභාගී විය හැක.

11. ඉදිරිපත් කරන ලංසුවෙහි වලංගු කාලය **2026 මාර්තු මස 31** වන දින දක්වා දීර්ඝ කළ යුතුය.

12. ඉදිරිපත් කරන ලංසුව සමග **2026 අප්‍රේල් මස 30** වන දින දක්වා වලංගු වන පරිදි ලංසු සුරක්ෂණයක් **ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය** නමින් ඉදිරිපත් කළ යුතුය. එම ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද කොන්දේසි විරහිතව, ආපසු හැරවිය නොහැකි මුදල් බවට පරිවර්තනය කළ හැකි ලංසු සුරක්ෂණයෙහි මුල් පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. (අදාල බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) ලංසු සුරක්ෂණයෙහි වටිනාකම මිල දී ගැනීමේ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලංසු ලේඛනයෙහි සඳහන් කර ඇත.

13. ගැනුම්කරුවන් විසින් අවශ්‍ය යැයි දක්වා ඇති පරිදි නිෂ්පාදන අවසර සහතිකය අවශ්‍ය නම්, එය පශ්චාත් සුදුසුකම් අවශ්‍යතාවයක් විය හැක.

14. ලංසුකරුවන් විසින් ලංසු ලේඛනයෙහි අමතර තොරතුරු ඉල්ලා ඇති නිශ්චිත අයිතම සඳහා නියැදි අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු ය. **නියමිත කාල සීමාව තුල නියැදියන් ලබා නොදෙන ලංසුකරුවන්ගේ ලංසු ඉදිරියට ලංසු සැලකිල්ලට නොගන්නා අතර, එම ලංසුව ප්‍රතිචාර නොදැක්වූ ලංසුවක් වශයෙන් සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

15. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට අවශ්‍ය අතිරේක විස්තර වෙතොත් **ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්)** මගින් ලබා ගත හැකි අතර, ඊට අදාල ලංසු ලිපි ලේඛණ පහත ඡේද අංක 16 දක්වා ඇති ලිපිනයේ දී කිසිදු ගාස්තු ගෙවීමකින් තොරව **2025.06.23** වන දින සිට **2025.07.14** වන දිනයන්හි **පෙ.ව 09.00 සිට ප.ව 03.00** දක්වා පරීක්ෂා කළ හැකිය.

16. ඉහත සඳහන් කළ ලිපිනය

| | | |
|---|---|---|
| **අවධානය** | : | අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්) |
| **ලිපිනය** | : | නාවික හමුදාධිපති,<br>නාවික හමුදා මූලස්ථානය,<br>තැ.පෙ. 593,<br>කොළඹ 01. |
| **දුරකථන අංකය** | : | 011 - 7190000 (දිගුව 12351), 011 - 7192351 |
| **ඊ මේල්** | : | nhqdnvc@gmail.com |

**සභාපති,**
**ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**(2026 වර්ෂය සඳහා ත්‍රිවිධ හමුදාව සඳහා අමු සහ වියළි ආහාර අයිතමයන් ප්‍රසම්පාදනය),**
**ආරක්ෂක අමාත්‍යාංශය.**
2025.06.20

SELACINE MEDIA SOLUTIONS